# දේව මෑණියන්ට ගී

## 376 කරුණාබර අත පා

කරුණාබර අත පා
යුද රකුසා නෙරපා
ලක්බිම බේරා දුන් මෑණියනේ
කරමුව ඔබ සිරිපා පිණිපා

ලංකා අප හිමිදු මාතාවෙනි – මේ සිරි ලක් බිම ඔබ සෙවණේ
සැමදා සුවදා සේ සුරකේවා – ලබමින් ඔබ නිරතුරු සරණේ

කරුණා සාගරියේ – ලංකා රාජිණියේ
ලක්දිව සපුරා නිති පැතිරේවා – මහිමය ඔබගේ ආදරයේ

සා දුක රෝ දුක යුද බිය ඈ සැම–උවදුරු ලක් දෙරණින් පලවා
සාමය සමගිය සදහම සොම්නස –නිරතුරු අප අතරෙහි රඳවා

ලක් දරු කැළ සැමදා – සෙවනෙහි සිරි සළදා
සාදරයෙන් සුරකින සේ අයදිමු – බැති ගී තුති ගී තිබඳ පුදා

අම්මා කියමින් අමතා අපගේ – දුක සැප නිති ඔබ හට පවසා
අයදිමු අපගේ මුළු ලක් දෙරණට – ඔබගේ ආසිරි මල් වරුසා

මාලති මල් මාලා – ගෙල වටැ පළඳාලා
සිරිපා අබිමුව හොබවමු සුවඳැති – සපු මල් නා මල් ගවසාලා